# සිසු ගොවි පියස

කෘෂිකර්මය හදාරන සිසුන් සඳහා
පළ කෙරෙන ලිපි පෙළේ දෙවැන්න

## එළවළු උස් තවාන් පාත්ති පාලනය

එළවළු බීජ තවාන් දැමීමේ හා තවාන් පාත්ති නඩත්තු කිරීමේ මූලික අරමුණ වන්නේ අඩු වියදමකින් නිරෝගී (රෝග හා කෘමි හානි වලින් තොර) හා දිරිමත් (හොඳ වර්ධනයක් ඇති) එළවළු බීජ පැළ නිෂ්පාදනය කර ගැනීමයි. එළවළු තවාන් පාලනයේදී මෙම අරමුණ ඉටු කරවා ගැනීමට හැකිවන සේ තවාන් පාත්ති නඩත්තු කරනු ලැබේ. පහත විස්තර වන්නේ ඉහත අරමුණ ඉටුකර ගැනීමට උස් එළවළු තවාන් පාත්ති නඩත්තු කරන ආකාරයකි.

### තවාන් පසේ ආම්ලිකතාවය නිවැරදිකර ගැනීම

තවාන් සඳහා සැලකිලිමත්ව සුදුසු බිම් කොටසක් තෝරාගත යුතුය. තෙත් කලාපයේ බොහෝ ප්‍රදේශවල පස ආම්ලිකය. තවාන් භූමියේ පසේ ආම්ලිකතාවය පළමුව නිවැරදි කළ යුතුය. මේ සඳහා පසට හුණු හෝ ඩොලමයිට් යෙදිය හැක. තවානේ බීජ සිටුවීමට දින 14 කට පෙර පසට හුණු හෝ ඩොලමයිට් යොදා පස සමග හොඳින් මිශ්‍ර කළ යුතුය.

### උස් තවාන් සෑදු ගැනීම

හොඳින් බිම් පෙරලා, ආම්ලිකතාව නිවැරදි කර, මට්ටම් කර ඇති ස්ථානයක මීටර 01 ක් පළලට හා මීටර 03 ක් දිගට තවාන් ස්ථානය සලකුණු කරගත යුතුවේ. ඉන් පසුව තවාන් පාත්ති වටේට සෙ. මී. 45 පමණ පළල කානුවක් සකස් කරන අතර ඉවත් කරන පස් පාත්තිය මතට දමනු ලැබේ. පාත්තියේ උස සෙ. මී 18 හෝ සෙ. මී 20 පමණ විය යුතුය තවාන් පාත්ති මතුපිට හොඳින් මට්ටම් කර ගල් වැනි රළු ද්‍රව්‍ය ඉවත් කළ යුතුය.

### තවාන් මිශ්‍රණය යෙදීම

ඉන් පසුව සෙ. මී. 05 ක ඝනකම ස්ථරයක් ඇතිවන සේ, තවාන මතුපිට තවාන් මිශ්‍රණය අතුරනු ලැබේ. සල්ලඩයකින් හලාගත් මතුපිට පස් හා කොම්පෝස්ට් 1:1 අනුපාතයට මිශ්‍රකර තවාන් මිශ්‍රණය සාදගනු ලැබේ. තවාන් මිශ්‍රණය තවාන් පාත්ති මතුපිටට යෙදීමෙන් පහත සඳහන් වාසි ලැබේ. (1) බීජ සිටුවීමට සුදුසු සියුම් තවාන් මතුපිටක් ලැබේ. (2) බීජවල ප්‍රරෝහණය සඳහා අවශ්‍ය තෙතමනය රඳවා ගනී. (3) තවානෙන් පැල ගලවන විට මුල් වලට හානි සිදුවීම අඩුවේ.

### තවාන් ජීවානුහරණය

තවාන් පසේ හා තවාන් මිශ්‍රණයේ සිටින හානිකර ජීවීන්ගෙන් (පලිබෝධකයින්ගෙන්) තවාන් පැලවලට හානි සිදුවේ. තවාන් වල දක්නට ලැබෙන සුලභ පලිබෝධකයින් අතර රෝග කාරක දිලීර, බැක්ටීරියා හා වටපණු වැනි ජීවීන්ද, බීජ හා තවාන් පැල වලට හානි කරන කුහුඹුවන්, වේයන්, කියත්පණුවන් වැනි ජීවීන්ද වෙනත් හානිකර කෘමීන් හා ඔවුන්ගේ විවිධ ජීවන අවස්ථාද වල් පැලෑටිද වේ. තවාන් පසේ හා තවාන් මිශ්‍රණයේ සිටින පලිබෝධකයින් (හානිකර ජීවීන්) විනාශ කිරීම 'තවාන් ජීවාණුහරණය' නම්වේ. භාවිතා කරන ජීවානුහරණ ක්‍රමය අනුව පූර්ණ ජීවානුහරණයක් හෝ අර්ධ ජීවාණුහරණයක් සිදුවිය හැක.

ලංකාවේ එළවළු ජීවාණුහරණය කිරීමට සුලභව භාවිතා කරන ක්‍රම ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැක. එනම් රසායනික ජීවාණුහරණ ක්‍රම හා භෞතික ජීවාණුහරණ ක්‍රම

ගනුවෙනී. භෞතික ජීවාණුහරණ ක්‍රම වලින් වඩාත්ම ජනප්‍රිය ක්‍රමය වන්නේ පිදුරු හා දහයියා වැනි ද්‍රව්‍ය අතුරා තවාන් මතුපිට ගිනි තැබීමයි. සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට මෙහිදී තවාන් මිශ්‍රණය හා පස සෙ. මී. 7.5 ගැඹුරට තෙමෙනසේ තවාන මතට මල් බාල්දියකින් ජලය වත්කර, ඉන් පසුව පිදුරු හා දහයියා මාරුවෙන් මාරුවට තට්ටු වශයෙන් තවාන මතුපිට තැන්පත් කළ යුතුවේ. ඉන් පසුව තද සුළං නොමැති අවස්ථාවක සෙමින් ගිනි ගන්නාසේ ගිනි තබනු ලැබේ. පිදුරු හා දහයියා දැවී පිටවෙන තාපය නිසා තවාන් මිශ්‍රණයේ හා තවාන් පසේ ඇති ජලය රත්වී ජල වාෂ්ප සෑදී තවාන් ජීවාණුහරණය වේ.

භාවිතා වන වෙනත් ජීවාණුහරණ ක්‍රම අතර තවාන් පසට හා තවාන් මිශ්‍රණයට උතුරන උණු වතුර වත් කිරීම, තෙත් තවාන් මිශ්‍රණය හා තවාන් පස යකඩ තැටියක් මත තබා ගිනි මැලයක ආධාරයෙන් රත් කිරීම හා තවාන් භූමියේ පස නිතර නිතර මාස කීපයක් පෙරලා දැඩි හිරු රැස්වලට භාජනය කිරීමද වේ.

රසායනික ජීවාණුහරණයේදී විවිධ රසායනික ද්‍රව්‍ය භාවිතා කරමින් තවාන් පසේ හා තවාන් මිශ්‍රණයේ සිටින හානිකර ජීවීන් විනාශ කරනු ලැබේ. රසායනික ජීවාණුහරණයේදී ප්‍රදේශයේ එළවළු තවාන් වලට හානි කරන ජීවීන් අනුව සුදුසු රසායනික ද්‍රව්‍ය තෝරාගෙන, තවාන් ජීවාණුහරණයට යොදගත යුතුය.

සමහර ප්‍රදේශවල එළවළු තවාන්වල දියමලන් කැමේ රෝගය ඇති කරන සමහර හානිකර පාංශු දිලීර මර්ධනයට මොරුව් නම් දිලීර නාශකය නිර්දේශ කර ඇත. මොරුව් ග්‍රෑම 05 ක් ජලය ලීටර 10 ක දියකර තවානේ වර්ග මීටර් 01 යෙදීමට නිර්දේශිතයි. බීජ සිටුවීමට දින 02 පෙර මෙම පාංශු දිලීර නාශකය යෙදිය යුතුයි. කැප්ටාන් නම් දිලීර නාශකයද සමහර පාංශු දිලීර විශේෂයන් මර්ධනයට තවාන් ජීවාණුහරණයේදී යොදගනු ලැබේ. 3% කාබො පියුරාන් කැට හා ෂෙල් ඩී ඩී. තවාන් පසේ හානිකර වටපණුවන් හා සමහර පාංශු කෘමීන් විනාශ කිරීමට රසායනික ජීවාණුහරණයේදී භාවිතා කළ හැක.

## සිටුවීමට සුදුසු බීජවල ලක්ෂණ

එළවළු තවාන්වල බීජ පේළියට සිටුවීම සුදුසුය. බීජ සිටුවීමේදී නියමිත පරතරයට තවාන් පාත්ති මත හරස් අතට පේළි සකස්කර ගත යුතුවේ. එම පේළිවල නියමිත ගැඹුරට හා තුනීයට බීජ සිටුවීම කළ යුතුය. ගෝවා, නෝකෝල්, මල් ගෝවා ආදියේ තවාන්වල පේළි අතර පරතරය සෙ. මී. 12.5 ක් විය යුතුය. ලීක්ස්, තක්කාලි, වම්බටු, මාළු මිරිස් හා බීට් ආදියේ තවාන්වල පේළි අතර පරතරය සෙ. මී. 12.5 හෝ සෙ. මී. 15 විය යුතුය. ගෝවා, නෝකෝල් ලීක්ස්, මාළුමිරිස් හා බීට් ආදියේ තවාන්වල පේළි අතර පරතරය සෙ. මී. 12.5 හෝ සෙ. මී. 15 විය යුතුය. ගෝවා, නෝකෝල්, ලීක්ස්, මාළුමිරිස්, තක්කාලි, වම්බටු හා බීට් බෝගවල අක්කරයට අවශ්‍ය තවාන් පැල ලබාගැනීමට මීටර් 1 x මීටර 3 තවාන් පාත්ති පිළිවෙලින් 07, 07, 38, 13, 11, 09 හා 33 ක් බැගින් අවශ්‍යවේ. බීජ සුළු ප්‍රමාණයක් තවාන් දමන විට මීට වඩා වැඩි තවාන් බිම ප්‍රමාණයක් භාවිතා කිරීම සුදුසුය.

## බීජ ප්‍රතිකාර කිරීම

ප්‍රරෝහණය වන බීජ පැලවලට හා කුඩා බීජ පැලවලට දිය මලන් කැමේ රෝගය තවානේදී ඇතිවීම වැළැක්මට බීජ ප්‍රතිකාර කරනු ලැබේ. බීජ ප්‍රතිකාර කිරීමේදී බීජ වලට සුදුසු දිලීර නාශකයක් මිශ්‍ර කරනු ලැබේ. කැප්ටාන් හෝ පෙර්මසාල් ෆේප්වේ වැනි දිලීර නාශක, බීජ සමඟ මිශ්‍ර කර බීජ ප්‍රතිකාර කරනු ලැබේ. මෙහිදී තවානේ සිටුවන බීජ සුදුසු දිලීර-නාශක ප්‍රමාණයක් සමග මිශ්‍ර කර බීජය වටා ආරක්ෂක තුනී දිලීර නාශක පටලයක් ඇති කරනු ලැබේ. බීජ සමග මිශ්‍ර කරන ප්‍රමාණය දිලීර නාශක වර්ගය අනුවද, එළවළු බීජ වර්ගය අනුවද, වෙනස්වේ. උදහරණ වශයෙන් බීජ ප්‍රතිකාර කිරීමේදී වම්බටු බීජ ග්‍රෑම් 125 කැප්ටාන් දිලීර නාශකයෙන් ග්‍රෑම 02 මිශ්‍ර කළ යුතුය.

## වසුන් යෙදීම

ප්‍රතිකාර කළ බීජ පේළිවල තුනීයට සිටුවා තවානේ මතුපිට ඇති තවාන් මිශ්‍රණයෙන්ම වසනු ලැබේ. ඉන්පසු පිරිසිදු තෙත් ගෝනි වලින් හෝ පිරිසිදු පිදුරු වලින් තවාන වසුන් කරනු ලැබේ. මෙසේ තවාන වසුන් කිරීමෙන් තවානේ

පසේ තෙතමනය ආරක්ෂාවීම, පසේ උෂ්ණත්වය ආරක්ෂාවීම හා තවානට ජලය යොදන විට පේලිවල ඇති බීජ විසිරී යාම වළකාලීම වැනි වාසි ලැබේ.

## ජල සම්පාදනය

බීජ සිටුවා වසුන් කළ පසු තවාන හොඳින් තෙමෙනසේ මල් බාල්දියකින් වසුන මතට ජලය සම්පාදනය කළ යුතුවේ. වියළි කාලගුණයක් ඇතිවිට, දිනපතා බීජ ප්‍රරෝහණය වනතෙක් ජල සම්පාදනය කළ යුතුවේ. බීජ ප්‍රරෝහණය වීමට ගතවන කාලය සිටුවා ඇති බීජ වර්ගය අනුව වෙනස්වේ. මුල් දින කිපයේ විටින් විට වසුන ඉවත්කර තවාන් කළ බීජවලට කුහුඹුවන් හා වෙයන් වැනි ජීවීන්ගෙන් හානි සිදුවන්නේ දැයි පරීක්ෂා කළ යුතුයි. හානියක් ඇතොත් එම හානිය මර්ධනය කිරීමට සුදුසු කටයුතු කළ යුතුවේ. බීජ පැලවීම ආරම්භයත් සමග නිසි කලට වසුන ඉවත් කිරීම ඉතා වැදගත්වේ.

වර්ධනය වන බීජ පැල සහිත තවාන්වලට ජල සම්පාදනය කරන විට එම පැලවලට ජල හිඟයක් ඇති නොවන පරිදි කළ යුතුවේ. නමුත් අධික ලෙස තවාන් වලට ජලය යෙදීමෙන් තවාන් පැලවල වර්ධනය අඩුවන අතර දියමලන් කෑම වැනි තවාන් පැලවලට සෑදෙන රෝග අධික වීමට ඉඩ ඇත.

## පැල තුනී කිරීම

බීජ ප්‍රරෝහණය වී දින 8 ක් හෝ 10 පමණ ගතවූ පසු පැල ගහණය අධික ස්ථාන වලින් පැල ඉවත්කර තුනී කළ යුතුය. මෙය තවාන් පැලවල ඒකාකාර වර්ධනයක් ඇති කිරීමට ආධාරයකි.

## පස බුරුල් කිරීම

සමහර ප්‍රදේශවල පසේ මැටි අධික ස්වභාවය හා වෙනත් හේතූන් නිසා තවානේ පැල පේලි අතර පස තදවී පැලවල වර්ධනය බාලවන බව ඇතැම් විට දක්නට ලැබේ. විශේෂයෙන් තවාන් මිශ්‍රණය යොද නැති තවාන්වල මෙම තත්වය සුලභය. එවැනි අවස්ථාවලදී පැල පේලි අතර පස නොගැඹුරව බුරුල් කිරීම වැදගත් වේ.

## තවාන් ආවරණ කිරීම

අධික වර්ෂාවෙන් හා අධික හිරු රශ්මි වලින් තවාන් පැල ආරක්ෂා කර ගැනීමට එළවළු තවාන් ආවරණය කරනු ලැබේ. තවාන් ආවරණය කිරීමට පොලිතීන් හෝ පොල් අතු සුලභව භාවිතා කරයි. රාත්‍රී කාලයේ පිනි වැටීමෙන් හානිවන රතුළූණු හා බොම්බයි ළූණු බීජ පැල තවාන් වලට හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි එසේ කිරීම වැදගත් වේ. වැඩුනු තවාන් පැලවලට සෙ.මී. 05 වක් උසින් තවාන් ආවරණය පිහිටන පරිදි එය සකස් කිරීම වැදගත්වේ. අනවශ්‍ය පරිදි තවාන් දවල් කාලයේ ආවරණය කර තැබීමෙන් තවාන් පැල දුර්වලවීම හා උසට වර්ධනයවීම සිදුවේ. මෙවැනි තත්වයක් ඇතිවීම වළකා ගත යුතු වේ.

## වල් පැලෑටි මර්ධනය

විටින් විට තවානේ ඇති වල් පැලෑටි අතින් උදුරා ඉවත් කළ යුතුවේ. මෙමගින් එළවළු තවාන් පැල හා වල් පැලෑටි අතර වර්ධක සම්පත් (එනම් ජලය, හිරු එළිය, ඉඩකඩ, පොහොර) සඳහා ඇතිවන තරඟය අවම කළ හැක. තවානේ ඇති වල්පැල ගැලවීමේදී එළවළු බීජ පැල වලට හානි නොවන පරිදි ගැලවීමට සැළකිලිමත් විය යුතුය.

## කරකරන ලද දහයියා හෝ පිදුරු ඇතිරීම

සමහර ප්‍රදේශවල ගොවීන් දියමලන් කෑමේ රෝගය වළකා ගැනීමට සොලනේසියේ කුලයේ බෝග සිටුවා ඇති එළවළු තවාන්වල පැල පේලි අතර කරකරන ලද දහයියා හෝ පිදුරු සෙ.මී. 01 ඝණකමට ඇතිරීම කරනු ලැබේ. තවාන් පැලවල උස සෙ.මී. 04 පමණ වූ විට මෙසේ කරකරන ලද දහයියා හෝ පිදුරු පේලි අතර ඇතිරීම කරනු ලැබේ.

## පොහොර යෙදීම

එළවළු තවාන් පැලවල වර්ධනය දුර්වල නම් නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් අඩංගු දියර පොහොරක් හෝ කැට පොහොරක් තවාන් වලට යෙදීම සුදුසුය. නමුත් හොඳින් වර්ධනය වන එළවළු තවාන්වලට පොහොර යෙදීම නොකළ යුතුය. අනවශ්‍ය පරිදි තවාන්වලට පොහොර යෙදීමෙන් පැල මාංශල බවට පත්වී ගලවන විට කැලෙන අතර ක්ෂේත්‍රයේ සිටවූ විට මිය යෑමට හැක. තවද මෙවැනි මාංශල තවාන් පැල තවානේදී පහසුවෙන් දියමලන් කෑමේ රෝගයට පාත්‍රවේ.

## පලිබෝධ හානි මර්ධනය

නිරෝගී හා දිරිමත් තවාන් පැල නිෂ්පාදනය සඳහා තවානේ පලිබෝධ මර්ධනය වැදගත්වේ. පත්‍රවලට හානිකරන දළඹුවන්, විවිධ කුරුමිණියන් කුඩා පැල කපා දමන දුඹුරුපැහැති කියත් පණුවන්ගේ වට පණුවන්ගේ හා ගොළුබෙල්ලන්ගේ හානි එළවළු තවාන්වල සුලභව දක්නට ලැබේ. පත්‍රවලට හානි කරන සමහර දළඹුවන් හා සමහර කුරුමිණියන් මර්ධනයම 60% මොනොක්‍රොටෆොස් කෘමි නාශකය යෙදීම සුදුසුය. වටපණු හානිය ඇති ප්‍රදේශවල තක්කාලි, බොම්බයි ළූණු හා ලීක්ස් තවාන්වල බීජ සිටුවීමට ප්‍රථම පසට 3% කාබෝෆියුරාන් කැට මිශ්‍ර කිරීම සුදුසුය. ගොළු බෙල්ලන් මර්ධනයට 'මෙටා' නම් ගොළුබෙලි නාශකය යෙදීම හෝ එම ජීවීන් අතින් එකතුකර විනාශකිරීම හෝ තවාන වටා අළුහුණු යෙදීම හෝ සුදුසුය. තවාන් පැල පාමුලෙන් කපා දමන දුඹුරු පැහැති කියත් පනුවන් මර්ධනයට 50% ප්‍රොපෙනොෆොස් හෝ 50% ෆොකියෝෆොස් කෘමි නාශක යෙදීම සුදුසුය.

තවානේ දියමලන් කැමේ රෝගය දක්නට ලැබුණු විට එම රෝගී පැල ගලවා ඉවත්කර කැප්ටාන් ග්‍රෑම් 25 ක් ජලය ලීටර් 4½ දියකර නිරෝගී පැලවල පාමුලට වදින සේ ඉසීම සුදුසුය. වම්බටු තවාන්වල, මාළුමිරිස් තවාන්වල සමහර පත්‍ර පුල්ලි රෝග මර්ධනයට හා තක්කාලි තවාන් වල පශ්චිම අංග මාර රෝගය මර්ධනයට ඇන්ත්‍රකොල්, මොන්ඩසෙබ් වැනි දිලීර නාශකයක් යෙදීම සුදුසුය. ඔරවා රෝගය (මුල් මහත්වීමේ රෝගය) සුලභ ප්‍රදේශවල ගෝවා, නෝකෝල් හා මල් ගෝවා තවාන් සෑම විටම රෝග කාරක දිලීරයන්ගෙන් තොර ස්ථානයක පිහිටුවීම වැදගත් වන්නේ, තවාන් පසේ රෝග කාරක දිලීරය මර්ධනය කිරීමේ සාර්ථක අඩුවියදම් ක්‍රමයක් තවම නිර්දේශකර නැති බැවිනි.

## පැල දැඩි කිරීම

තවාන් වල පැල දැඩි කිරීම පැල තවානෙන් ගැලවීමට දින 10 කට පෙර ආරම්භ කළයුතුය. තවාන් පැල දැඩි කිරීමෙන් තවාන් පැලවලට ක්ෂේත්‍රයේදී ජල හිඟයකට හා අධික හිරුඑළිය වලට ඔරොත්තු දීමේ හැකියාව ඇතිවේ. මේ නිසා තවාන් පැල ගලවා ක්ෂේත්‍රයේ සිටුවීමේදී පැල මිය යෑම අඩුවේ. පැල දැඩිකිරීම සඳහා ක්‍රමයෙන් ජල සම්පාදනය අඩුකර, තවාන් පැල වැඩි වේලාවක් හිරුඑළියට භාජනය කර අහිතකර පරිසර තත්වයන්ට හුරු කරනු ලැබේ.

## වෙනත් පාලන කටයුතු

එළවළු තවාන්වල සමහරවිට සාමාන්‍ය තවාන් පැල වලට වඩා වෙනස් ලක්ෂණ සහිත පැල කීපයක් දක්නට ලැබේ. එවැනි අස්වාභාවික ලක්ෂණ පෙන්වන පැල ගලවා ඉවත් කළයුතුය. ලීක්ස් තවාන්වල තවාන් කාලයේ අවසාන සති කීපයේදී පැල සෙ. මී. 15 පමණ උසට වැඩේ. මේ කාලයේදී හදිසියේ ඇතිවන වණාව සහිත තද සුළං නිසා තවාන් පැල පැත්තට පෙරලී කුණුවීමට භාජනය් වේ. එවැනි අවස්ථාවලදී තවාන් පැල පොළවේ සිට සෙ.මී. 7.5 ඉතිරිවනසේ අග කෙටස් කපා දමා පැල කුණුවීම වළකාලීමට කටයුතු කළයුතු වේ.

## පැල ගැලවීම

තවානේ පැල ගලවන කාල සීමාව එළවළු වර්ගය අනුවද, සමහරවිට එකම එළවළු වර්ගයේ විවිධ ප්‍රභේද අනුවද වෙනස්වේ. තක්කාලි තවාන් පැල දින 14 කදීද, නෝකෝල්, මල් ගෝවා, බීට් වම්බටු තවාන් පැල සති 3 ත් 4 ත් අතර කාලයකදීද, ලීක්ස් තවාන් පැල සති 10 කදීද, මාලු මිරිස් තවාන් පැල දින 21 කදීද ගලවා ක්ෂේත්‍රයේ සිටවනු ලැබේ. ගෝවා වල කෙටි කාලීන කේ. වයි. වැනි ප්‍රභේද දින 21 කදීද. දිගු කාලීන එස්. ඩී. වැනි ප්‍රභේද දින 25 ත් 28 ත් අතර කාලයකදීද තවානෙන් ගලවා ක්ෂේත්‍රයේ සිටුවනු ලැබේ. ක්ෂේත්‍රයේ සිටුවීමට තවානේ ඇති නිරෝගී හා දිරිමත් පැල පමණක් තෝරාගත යුතුවේ.

තවානේ පැල ගැලවීමට දිනකට පෙර තවාන හොඳින් තෙත් කළ යුතුවේ. පැල ගලවන විට තවාන් පැල පේළි අතර පස් බුරුල් කර පැල නොකැඩෙන සේ ගලවා ගත යුතුවේ. ගෝවා, මල් ගෝවා, නෝකෝල් ආදියේ අග්‍රස්ථ අංකුර වලට හානියක් නොවන සේ පැල ගලවා ගැනීමට සැලකිලිමත් වියයුතුය.

## පැල සකස් කරගැනීම

නුවරඑළිය ප්‍රදේශයේ ගොවීන් ලීක්ස්, බීට වැනි තවාන් පැල ගලවා ගත් පසු, ක්ෂේත්‍රයේ සිටුවීමට පෙර මුල් හා පත්‍ර අර්ධ වශයෙන් ඉවත් කර පැල සකස්කර ගනු ලැබේ, මෙහිදී ලීක්ස්, බීට වල පත්‍ර අර්ධ වශයෙන් කපා ඉවත් කරනු ලැබේ. බීට වල මුදුන් මුලේ අගිස් කොටස් කපා දමන අතර ලීක්ස් වල මුල් සෙ. මී. 01 පමණ ඉතිරිවනසේ ඉතිරි අග කොටස් කපා දමනු ලැබේ. මෙසේ බීට හා ලීක්ස් පැල සකස්කර සිටුවීමෙන් ක්ෂේත්‍රයේ පැල මිය යෑම අඩුවේ.

කුණ්ඩසාලේ ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයේ කථිකාචාර්ය
පී. කේ. කේ. පෙරේරා

---

# සහල් නිෂ්පාදනය

- ලොව පුරා රටවල් 90 ක පමණ හෙක්ටයාර දශ ලක්ෂ 150 ක වී වගා කරනු ලැබේ.
- මෙ මගින් ලබා ඇති ලෝක වී නිෂ්පාදනය බුසල් දශ ලක්ෂ 20815 කි.
- මෙම අස්වැන්නෙන් ටොන් දශ ලක්ෂ 150 ක් පමණ, සහල් නිෂ්පාදනය තෙක් වූ ක්‍රියා වලියේදී අතර මග අපතේ යයි.
- ලංකාවේද වී නිෂ්පාදනයෙන් 10%—15% අතර ප්‍රමාණයක් වාර්ෂිකව මෙම ක්‍රියාවලියේදී අපතේ යයි. මෙම ප්‍රමාණය මෙට්‍රික් ටොන් ලක්ෂ 2—3 අතර වේ.
- ශ්‍රී ලංකාවේ වසරකට අවශ්‍ය වන සහල් ප්‍රමාණය ටොන් දශ ලක්ෂ 1.6 ක් පමණ වන අතර එක් පුද්ගලයෙකුගේ වාර්ෂික සහල් පරිභෝජනය කිලෝ ග්‍රෑම 120 ක් පමණ වේ.
- මේ සඳහා ශ්‍රී ලංකාවේ වාර්ෂිකව යල—මහ දෙකන්නයේදී වී බුසල් දශ ලක්ෂ 2—3 අතර නිපද වේ. මින් 60% ක් මහ කන්නයේද, ඉතිරිය යලවද වේ.
- එසේත් ශ්‍රී ලංකාවේ සහල් ඉල්ලුමෙන් 5%—20% අතර ප්‍රමාණයක් වාර්ෂිකව ආනයනය කිරීමටද සිදුවේ.

මේ අනුව බලන විට අපගේ අපතේ යන සහල් ප්‍රමාණයෙන් (මුළු නිෂ්පාදනයෙන් 10%—15% අතර) කොටසක් ඉතුරු කරගතහොත් අපගේ අවශ්‍යතාවයන් සෑහෙන දුරකට දේශියවම සපයා ගැනීමට හැකි වනවා නොද?

(මහ බැංකු වාර්තා ඇසුරෙනි)

**National Digitization Project**

***National Science Foundation***

Institute : Department of Agriculture

1. Place of Scanning : Department of Agriculture, Peradeniya
2. Date Scanned : 2018/1/9
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : G. E. P. Dilshan

Signature : ...

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Chief Librarian

Name : Saumya Upamalika

Signature : ...

Date : 2018/1/9

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*